ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව
வங்கியல்லா நிதியியல் நிறுவனங்களின் மேற்பார்வைத் திணைக்களம்
DEPARTMENT OF SUPERVISION OF NON-BANK FINANCIAL INSTITUTIONS

අංක 30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
இல. 30, சனாதிபதி மாவத்தை, கொழும்பு - 01, இலங்கை
No. 30, Janadhipathi Mawatha, Colombo 01, Sri Lanka

**යොමු අංකය: 24/10/001/0019/005**

2023 ජනවාරි 31

ප්‍රධාන විධායක නිලධාරීන්
බලපත්‍රලාභී මුදල් සමාගම්

මහත්මයාණනි/ මහත්මියනි

**ලාභාංශ ප්‍රකාශයට පත් කිරීම හෝ ලාභය නැවත ප්‍රේෂණය කිරීම පිළිබඳ මාර්ගෝපදේශ**

මේ සමඟ අමුණා ඇති සියලුම බලපත්‍රලාභී මුදල් සමාගම් වෙත ලාභාංශ ප්‍රකාශයට පත් කිරීම හෝ ලාභය නැවත ප්‍රේෂණය කිරීම පිළිබඳ මාර්ගෝපදේශය 2023.02.01 දින සිට බලපැවැත්වේ.

අමුණා ඇති මෙම මාර්ගෝපදේශ අදාළ සියලුම නිලධාරීන් වෙත දැනුම් දෙන ලෙසත්, මෙම මාර්ගෝපදේශවල දක්වා ඇති අවශ්‍යතා සමඟ අනුකූල වන ලෙසත් මෙමගින් ඔබ වෙත දැනුම් දෙනු ලැබේ.

මීට විශ්වාසී,

ආර්. එම්. සී. එච්. කේ. ජයසිංහ මිය.
**අධ්‍යක්ෂ**

*ඇමුණුම*: ලාභාංශ ප්‍රකාශයට පත් කිරීම හෝ ලාභය නැවත ප්‍රේෂණය කිරීම පිළිබඳ මාර්ගෝපදේශ

**ලාභාංශ ප්‍රකාශයට පත් කිරීම හෝ ලාභය නැවත ප්‍රේෂණය කිරීම පිළිබඳ මාර්ගෝපදේශ**

**1. මාර්ගෝපදේශවල අරමුණ**

1.1 බලපත්‍රලාභී මුදල් සමාගම් ලාභාංශ ප්‍රකාශයට පත් කිරීම හෝ ලාභය නැවත ප්‍රේෂණය කිරීම පිළිබඳ තීරණය කිරීමේ දී, කොටස්කරුවන් වෙත ප්‍රතිලාභ නැවත ලබා දීම සහ අලාභ අවශෝෂණය කිරීමට, සහ අනාගත ව්‍යාපාර වර්ධනයට අරමුදල් රඳවා තබා ගැනීම අතර තුලනයක් පවත්වා ගත යුතුය. මෙම මාර්ගෝපදේශය, අවිනිශ්චිත කාල වකවානු තුළ හට ගත හැකි ආර්ථික කම්පන අවශෝෂණය කර ගැනීම සඳහා බලපත්‍රලාභී මුදල් සමාගම්වල ඔරොත්තු දීමේ හැකියාව සහ ධාරිතාව ශක්තිමත් කිරීමට සහ ප්‍රමාණවත් ප්‍රාග්ධනයක් පවත්වා ගෙන යෑමෙන් ගනුදෙනුකරුවන්ගේ ණය අවශ්‍යතා සඳහා අඛණ්ඩව සහාය ලබා දීමේ පියවරක් ලෙස නිකුත් කරනු ලැබේ.

**2. අදාළත්වය**

2.1 සියලු බලපත්‍රලාභී මුදල් සමාගම්වල 2022.04.01 දින හෝ ඉන්පසු ඇරඹෙන මූල්‍ය වර්ෂයන්ට මෙම මාර්ගෝපදේශ අදාළ වේ.

**3. පූර්ව අනුමැතිය**

3.1 අතුරු/අවසන් ලාභාංශ ප්‍රකාශයට පත් කිරීම හෝ ලාභය නැවත ප්‍රේෂණය කිරීම සඳහා බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂගේ පූර්ව අනුමැතිය ලබා ගත යුතු වේ.

3.2 බලපත්‍රලාභී මුදල් සමාගම් ලාභාංශ ප්‍රකාශයට පත් කිරීම හෝ ලාභය නැවත ප්‍රේෂණය කිරීම සඳහා බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ වෙත ඉල්ලීමක් සිදු කරනු ලබන අවස්ථාවේ දී, මෙම මාර්ගෝපදේශයේ 4 වන වගන්තියෙහි සඳහන් කර ඇති පරිදි අවම නිර්ණායක/කොන්දේසි සපුරාලිය යුතු වේ. බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ විසින් මෙම අවම නිර්ණායක/කොන්දේසි සහ මීට අමතර ව, බලපත්‍රලාභී මුදල් සමාගමේ මූල්‍ය තත්ත්වය සහ/හෝ සමස්ත මූල්‍ය පද්ධති ස්ථායිතාව සඳහා බලපාන වෙනත් යම් නිශ්චිත සාධක මත පදනම් ව මෙම ඉල්ලීම් අවස්ථානුකූල ව ඇගයීම කරනු ඇත.

**4. සපුරාලිය යුතු අවම නිර්ණායක/ කොන්දේසි**

4.1 බලපත්‍රලාභී මුදල් සමාගම් විසින් යෝජිත ලාභාංශ ගෙවීම් සඳහා;

අ. බලපත්‍රලාභී මුදල් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද ලාභාංශ ප්‍රතිපත්තිය සමඟ යෝජිත ලාභාංශ ප්‍රකාශයට පත් කිරීම් අනුකූල වන බවට තහවුරු කළ යුතු වේ.

ආ. යෝජිත ලාභාංශ ප්‍රකාශයට පත් කිරීමට පෙර ලිත් මාසය සඳහා සිදු කළ පහත ගණනය කිරීම් යොමු කළ යුතු ය.

i) යෝජිත ලාභාංශ සඳහා ගැලපීම් සිදු කිරීමෙන් අනතුරුව, 2013 අංක 04 දරන මුදල් සමාගම් (ද්‍රවශීල වත්කම්) විධානයේ (සංශෝධිත පරිදි) සඳහන් විචක්ෂණ අනුපාත ගණනය කිරීම. බලපත්‍රලාභී මුදල් සමාගම්, යෝජිත ලාභාංශ සඳහා ගැලපීම් සිදු කිරීමෙන් පසු මෙම විධානයේ අවම අවශ්‍යතා සමඟ අනුකූල විය යුතු ය.

ii) යෝජිත ලාභාංශ සඳහා ගැලපීම් සිදු කිරීමෙන් අනතුරුව, මුදල් ව්‍යාපාර පනත යටතේ නිකුත් කරන ලද 2018 අංක 03 දරන ප්‍රාග්ධන ප්‍රමාණාත්මක අවශ්‍යතා විධානයේ (සංශෝධිත පරිදි) සඳහන් විචක්ෂණ අනුපාත ගණනය කිරීම. බලපත්‍රලාභී මුදල් සමාගම්, යෝජිත ලාභාංශ සඳහා ගැලපීම් සිදු කිරීමෙන් පසු මෙම විධානයේ අවම අවශ්‍යතා සමඟ අනුකූල විය යුතු ය.

iii) යෝජිත ලාභාංශ සඳහා ගැලපීම් සිදු කිරීමෙන් අනතුරුව, මුදල් ව්‍යාපාර පනත යටතේ නිකුත් කරන ලද 2017 අංක 02 දරන අවම මූලික ප්‍රාග්ධනය පිළිබඳ විධානයේ (සංශෝධිත පරිදි) සඳහන් පරිදි මූලික ප්‍රාග්ධනය ගණනය කිරීම. බලපත්‍රලාභී මුදල් සමාගම්, යෝජිත ලාභාංශ සඳහා ගැළපීම් සිදු කිරීමෙන් පසු මෙම විධානයේ අවම අවශ්‍යතා සමඟ අනුකූල විය යුතු ය.

ඇ. සාර්ව ආර්ථික කොන්දේසි සහ ඉදිරි තෙවසර සඳහා අපේක්ෂිත ව්‍යාපාර සැලසුම්වල වෙනස්වීම්වලට අනුකූල ව බලපත්‍රලාභී මුදල් සමාගම් නිරාවරණය වන සැලකිය යුතු අවදානම් (ණය පැහැර හැරීමේ අවදානම, ණය සංකේන්ද්‍රණ අවදානම ,වෙළෙඳපොළ අවදානම, ද්‍රවශීලතා අවදානම, මෙහෙයුම් අවදානම යනාදිය ඉහළ යාමට තුඩු දිය හැකි අවස්ථා/සිදු වීම් සලකා) සැලකිල්ලට ගනිමින් ද්‍රවශීලතාව, ඉපැයුම් සහ ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතාව සම්බන්ධව ආතති පරීක්ෂණ සිදු කළ යුතු අතර, ඊට සහාය වූ උපකල්පන සහ පෙර වැඩ සහිත ව එම ප්‍රතිඵල යොමු කළ යුතු ය. ආතති පරීක්ෂණවල ප්‍රතිඵල යෝජිත ලාභාංශ සඳහා ගැලපීම් සිදු කිරීමෙන් පසු 4.1. (ආ) හි සඳහන් විධානවල අවම අවශ්‍යතා සම්පූර්ණ කළ යුතු ය.

ඈ. අදාළ බලපත්‍රලාභී මුදල් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය සහ අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව විසින් 4.1. (අ) සිට (ඇ) දක්වා වගන්තිවල සඳහන් සැසඳුම් සහ ගණනය කිරීම් අනුමත කර ඇති බවට තහවුරු කළ යුතු ය.

ඉ. අදාළ බලපත්‍රලාභී මුදල් සමාගමේ නුබුන්වත්බව පිළිබඳ බාහිර විගණකයන්ගෙන් ලබා ගත් ප්‍රකාශයක් යොමු කළ යුතු ය.

**5. මින් පෙර පැවති මාර්ගෝපදේශය අවලංගු කිරීම**

බැංකු නොවන මූල්‍ය ආයතන ලෙස හැඳින්වෙන බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් සඳහා 'ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 32, 39 සහ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති 7 අනුගමනය කිරීම' පිළිබඳ වූ 2013 අංක 01 දරන මාර්ගෝපදේශය මින් ඉදිරියට, මෙමගින් අහෝසි කෙරේ.